ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2019 සැප්තැම්බර් මස 25 |

## පළාත් දළ දේශීය නිෂ්පාදිතය - 2018

***බස්නාහිර පළාත 2018 වසරේදී ද අඛණ්ඩව රටේ ආර්ථිකයට ඉහළම දායකත්වය ලබා දී ඇති අතර මධ්‍යම හා වයඹ පළාත් පිළිවෙලින් දෙවන හා සහ තෙවන ඉහළම දායකත්ව ලබා දී ඇත.***

**විශේෂ කරුණු**

**නාමික ද.දේ.නි. - 2018**
**රු. බිලියන 14,450**

**ප.ද.දේ.නි. දායකත්වය - 2018**
ඉහළම අගය
**බස්නාහිර පළාත:**
වාර්ෂික ලක්ෂමය පදනම මත දායකත්වය ඉහළ යෑමක් දක්නට ලැබුණි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2018 වසර සඳහා ඇස්තමේන්තු කර ඇති පළාත් දළ දේශීය නිෂ්පාදිත (ප.ද.දේ.නි.)[1] අගයන්ට අනුව බස්නාහිර පළාත රටේ ආර්ථිකයට අඛණ්ඩව ඉහළම දායකත්වය ලබා දෙන පළාත බව, පෙනී යයි. දෙවන සහ තෙවන ඉහළම දායකත්ව පිළිවෙලින් මධ්‍යම සහ වයඹ පළාත් විසින් ලබා දෙන ලදී.

සංඛ්‍යා සටහන 1
**පළාත් අනුව නාමික ද.දේ.නි.: 2017- 2018** (රු. බිලියන)


| පළාත | 2017(අ) | 2018(ආ) |
|---|---|---|
| බස්නාහිර | 5,086 | 5,558 |
| මධ්‍යම | 1,622 | 1,710 |
| වයඹ | 1,478 | 1,593 |
| දකුණු | 1,348 | 1,440 |
| සබරගමුව | 1,054 | 1,097 |
| ඌව | 776 | 828 |
| උතුරු මැද | 755 | 821 |
| නැගෙනහිර | 749 | 815 |
| උතුරු | 550 | 588 |
| **ශ්‍රී ලංකාව** | **13,418** | **14,450** |

අ. සංශෝධිත
ආ. තාවකාලික

*මූලය:* ශ්‍රී ලංකා මහ බැංකුව

වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, ප.ද.දේ.නි. දායකත්වයේ ඉහළම වර්ධනය බස්නාහිර පළාතෙන් වාර්තා විය. මීට අමතරව, ප.ද.දේ.නි. දායකත්වයේ වර්ධනයක් වාර්තා වූයේ උතුරු මැද පළාතෙන් පමණි. 2018 වර්ෂයේ දී මධ්‍යම, සබරගමුව සහ ඌව පළාත් වල දායකත්වයේ අඩු වීමක් පෙන්නුම් කළ අතර වයඹ, දකුණු, නැගෙනහිර සහ උතුරු යන පළාත් වල දායකතවයේ කිසිදු වෙනස් වීමක් වාර්තා නොවිණි.

රූප සටහන 1
**පළාත් අනුව ද.දේ.නි. දායකත්වය (%): 2017- 2018**




*මූලය:* ශ්‍රී ලංකා මහ බැංකුව

[1] ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන නාමික දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.), සුදුසු දර්ශක යොදා ගනිමින් පළාත් අනුව බෙදා වෙන් කර ප.ද.දේ.නි. ඇස්තමේන්තු කර ඇත.

## පළාත් තුළ ආර්ථික කටයුතු

සියයට 50 කට වැඩි කැපී පෙනෙන දායකත්වයක් ලබා දෙමින් සේවා අංශය සෑම පළාතකම ප්‍රමුඛතම අංශය බවට පත්ව තිබුණි. ජාතික ද.දේ.නි. හි දක්නට ලැබෙන ප්‍රවණතාවන්ට අනුව යමින් ප්‍රවාහන කටයුතු, තොග සහ සිල්ලර වෙළෙඳාම සහ වෙනත් පෞද්ගලික සේවා කටයුතු, පළාත් තුළ සේවා අංශයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

ප.ද.දේ.නි. සඳහා කර්මාන්ත කටයුතුවලින් ලැබෙන දායකත්වය සියයට 16.2 (උතුරු මැද පළාත) සිට සියයට 32.8 (බස්නාහිර පළාත) දක්වා වූ අගය පරාසයක පැවතුණි. බොහෝ පළාත් වල මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක වූයේ ඉදි කිරීම් කර්මාන්තය සහ එම සේවාවන්; ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදන කටයුතු; රෙදිපිළි, නිමි ඇඳුම්, සම් හා සම් භාණ්ඩ නිෂ්පාදන කටයුතු; පතල් හා කැණීම් කර්මාන්ත කටයුතුය.

රටේ ජාතික ද.දේ.නි. හි ආංශික සංයුතියේ ප්‍රවණතාවයට අනුකූල වෙමින්, සියළුම පළාත් වල ප.ද.දේ.නි. සඳහා කෘෂිකාර්මික කටයුතු මගින් ලබා දී ඇති දායකත්වය අවම අගයක පැවති අතර එය සියයට 2.0 ත් සියයට 16.5 ත් අතර පරාසයක පැවතුණි. නැගෙනහිර පළාත සියයට 16.5 ක් වශයෙන් ඉහළම දායකත්වය වාර්තා කරන ලද අතර වී වගාව; කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව; සහ කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදන කටයුතු මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

සංඛ්‍යා සටහන 2

**පළාත් අනුව ආර්ථික කටයුතුවල[අ] ප්‍රතිශත දායකත්වය -2018[ආ]**

| පළාත | 2018 | | |
|---|---|---|---|
| | කෘෂිකර්මාන්ත | කර්මාන්ත | සේවා |
| මධ්‍යම | 7.9 | 28.8 | 55.0 |
| නැගෙනහිර | 16.5 | 17.7 | 57.5 |
| උතුරු මැද | 12.2 | 16.2 | 63.4 |
| වයඹ | 10.5 | 27.2 | 54.0 |
| උතුරු | 15.5 | 21.4 | 54.8 |
| සබරගමුව | 8.9 | 25.3 | 57.6 |
| දකුණු | 13.3 | 16.8 | 61.6 |
| ඌව | 13.2 | 27.6 | 50.9 |
| බස්නාහිර | 2.0 | 32.8 | 56.9 |
| **ශ්‍රී ලංකාව** | **7.9** | **27.0** | **56.8** |

*මූලය:* ශ්‍රී ලංකා මහ බැංකුව

අ. භාණ්ඩ හා සේවා මත පනවන ලද බදු සහ සහනාධාර ගැලපුම ඇතුළත්ව නොමැති බැවින්, කෘෂි කර්මාන්ත, කර්මාන්ත සහ සේවාවන්හි ප්‍රතිශතාත්මක දායකත්වයන්හි එකතුව 100 ට සමාන නොවේ.
ආ . තාවකාලික